සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 10 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව I | කාලය : පැය 3 යි. |
|---|---|---|

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 - 25 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය ඇසුරෙන් 1 - 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. දේව මනුස්සානං අත්ථි, බහු මනුස්සානං අත්ථි, මංඩපං අත්ථි
තොවිලයක් මේ කරන්නේ තොවිලයක්

B. යුද්දෙට මං ගියා ගෑනි ගෙදර තියා
මගේ යාළුවො මං එනතුරු ඇව බලාගයි නිරතුරු

C. ආවු... හොඳ වැදගත් බඩුවක් වගේ ..... කරකරවනවා වැඩියි යාපනේ හුම්කම්පාව වගේ

D. පුරසඳ පායා දිලෙන වැනි මූණ තිගේ

E. ගුරුන්නාන්සේ දූන් මොකද කරන්නේ
නානු ගා ගත්තානම් නාන්න එපායැ. ඔහොම ඉන්න පුළුවනැයි.

F. ඉදින් බබෝ ඉදින් - අතේ මගේ ඉදින්

01. B අක්ෂරයෙන් දැක්වෙන ගීතය අයත් නාට්‍යයේ නිර්මාපකයා වන්නේ,
    1. බන්දුල ජයවර්ධනය
    2. පරාක්‍රම නිරිඇල්ල
    3. හෙන්රි ජයසේන
    4. ධර්මසිරි බණ්ඩාරනායක

02. මැණික්පාල ශාන්තිකර්මයට අයත් අක්ෂරය වන්නේ,
    1. E
    2. C
    3. A
    4. B

03. නාඩගම් හා සම්බන්ධ අක්ෂරය වන්නේ,
    1. B F
    2. B D
    3. D F
    4. C B

04. E අක්ෂරයට අයත් ගද්‍ය කොටස,
    1. උඩරට ශාන්තිකර්මයට අයත් වේ.
    2. ස්ත්‍රීන් විෂයෙහි පැවැත්වේ.
    3. නව කාව්‍ය සම්ප්‍රදායට අයත් වේ.
    4. බලි ශාන්තිකරුමය

05. C අක්ෂරයෙන් දැක්වෙන්න්,

1. සන්නියකුමේ සූනියම් යකින්නගේ වේශේත්‍රය යි.
2. රිද්දි යාගයේ දරු නැලවිල්ල අවස්ථාවයි.
3. කැළණි පාලමේ සංවාදයකි.
4. පාලි පැමිණවීමේදී එන චරිතයකි.

06. නෘත්‍ය යන්නට ගැළපෙන වරණය තෝරන්න.

1. ලී කෙළි, සවරම් නැටුම්
2. මනිපුරි, කතකලි, භරත නාට්‍යම්
3. චිත්‍රපට, රූපවාහිනී වැඩමටහන්
4. වීදි නාට්‍ය, නාඩගම්, කෝළම්

07. ශ්‍රව්‍ය කලාවකි,

1. ඔපෙරා
2. මුද්‍රා නාට්‍ය
3. ගුවන් විදුලි නාට්‍ය
4. බැලේ

08. ආනුශංගික කලා අයත් වරණය වන්නේ,

1. නාට්‍ය පෙළ, රංගාලෝකය, පසුතල නිර්මාණය
2. නාට්‍ය සංගීතය, වේෂනිරූපනය, නාට්‍යෝපකරණ, අංග රචනය
3. අංග රචනය, රංගාලෝකය, සංවාද, රංග වස්ත්‍ර
4. නාට්‍ය පෙළ, සංවාද, නාට්‍ය සංගීත, අංග රචනය

09. පිටපතක් රහිතව ඉදිරිපත් කෙරෙන්නේ,

1. අභිරූපණ
2. ක්‍ෂණික නිරූපන
3. නාඩගම්
4. කෝළම්

10. කමත රංගභූමිය කරගත් නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,

1. නාගඩම්
2. කෝළම්
3. සොකරි
4. නූර්ති

11. දික්තල කාලගෝල නාට්‍යයේ එන චරිත වන්නේ,

1. මහෞෂධ, දික්සුරඹී, දික්පිටියා, කාලගෝල
2. චත්තුදත්ත, දික්පිටියා, කාලගෝල, දික්තල
3. චත්තුදත්ත, දික්සුරඹී, මහෞෂධ, විදූෂක
4. මහෞෂධ, දික්පිටියා, සිටිදුව, චත්තුදත්ත

12. නාට්‍ය කලාව සෙසු ප්‍රාසාංගික කලාවන්ගෙන් වෙනස් වන්නේ කුමකින්ද?

1. රංගාලෝකයෙන්
2. අංග රචනයෙන්
3. පසුතල නිර්මාණයෙන්
4. චතුර් අභිනයෙන්

13. ප්‍රොසීනියම් වේදිකාව හඳුන්වන තවත් නමකි,

1. ගගනිකාව
2. ඇරීනා වේදිකාව
3. පින්තූර රාමු වේදිකාව
4. නේපත්‍යාගාරය

14. නාට්‍යයක පසුබිම් සංගීතය අයත් වන්නේ,

1. ආහාර්ය අභිනයට
2. වාචික අභිනයට
3. සමාරෝපයට
4. සාත්වික අභිනයට


**15 - 20 දක්වා ප්‍රශ්නවලට පහත පින්තූර ඇසුරින් පිළිතුරු ලියන්න.**

A



B


C


D


E


15. හුණුවටයේ කතාවේ අසඩක්ගේ චරිතයෙන් රංගනයේ යෙදුනේ,
   1. A   2. B   3. C   4. D

16. ''ඉක්නේමුවායි'' නම් ග්‍රීක සැටරයෙන් අනුවර්තන නාට්‍යයක් රචනා කළේ,
   1. B   2. C   3. D   4. E

17. ''අපේ කට්ටිය'' නමින් රංග සමූහයේ නිර්මාණය කළේ,
   1. B   2. A   3. D   4. C

18. C ඡායාරූපයේ දැක්වෙන නාට්‍යකරුවාගේ නිර්මාණයකි,
   1. ජනරංගය   2. වීදි නාට්‍ය   3. ජනකරළිය   4. රංගභූමි

19. ජනේලය නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,
   1. C   2. A   3. E   4. D

20. සුභ සහ යස වේදිකා නාට්‍යයේ රංගනයේ යෙදුනේ,
   1. E   2. A   3. D   4. B

21. දික්තල කාලගෝල  නාට්‍යයේ එන ගීතයක් නොවන්නේ,
   1. අම්බරයේ සඳ සේ දිලේ   2. ආලේ බැන්ද මාගේ රම්‍යවන්
   3. පුරහඳ පායා දිලෙන වැනි   4. ලප නොම වන් සඳ සේ

22. ලෝකධර්මී නාට්‍යයක් වන්නේ,
   1. ජනේලය   2. සිංහබාහු   3. කැළණි පාලම   4. නරිබැණා

23. සූනියම් ශාන්තිකර්මය හා සම්බන්ධ චරිත වන්නේ,
   1. වඳ බිසෝවරු සත්දෙනා   2. සූනියම් යක්ෂණිය
   3. වඩිග පුර බමුණන්   4. කොර සන්නිය

24. සලු පාලිය අයත් වන්නේ,
   1. මඩු ශාන්තිකර්මයට ය.   2. රට යකුම ශාන්තිකර්මයට ය.
   3. මැණික්පාල ශාන්තිකර්මයට ය   4. සන්නි ශාන්තිකර්මයට

25. නරි බැණා නාට්‍ය අයත් වනුයේ,
   1. ශෛලිගත නාට්‍ය සම්ප්‍රදායට යි.   2. මුද්‍රා නාට්‍ය සම්ප්‍රදායට යි.
   3. ලෝකධර්මී නාට්‍ය සම්ප්‍රදායට යි.   4. මිශ්‍ර ශෛලිගත නාට්‍ය සම්ප්‍රදායට යි.

(25 x 2 = 50)

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 10 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව II | |
|---|---|---|

## II කොටස

■ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. මුළු ප්‍රශ්න ගණන පහයි.

01. i. නාට්‍ය යන්නට විද්වතුන් පැවසූ නිර්වචනයක් ලියන්න.
 ii. ඔබ දන්නා රංගභූමි දෙකක් ලියා ඒවායේ රංග සම්ප්‍රදාය ලියා දක්වන්න.
 iii. කතාන්දරයක හා නාට්‍යයක ඇති සමාන ලක්ෂණ දෙකක් ලියන්න.
 iv. කතාන්දරයකින් නාට්‍යයක් වෙනස් වන හේතු දෙකක් ලියන්න.
 v. රූපවාහිනී කලාව හා වේදිකා නාට්‍ය අතර ඇති අසමානතා දෙකක් ලියන්න. (2 x 5 = 10)

02. i. නෘත්ත යනු කුමක්ද? (ල. 2)
 ii. නෘත්‍ය යන්නට උදාහරණ 3 ක් ලියන්න. (ල. 3)
 iii. අනෙකුත් කලාවන්ගෙන් නාට්‍ය කලාව සුවිශේෂී වේ යන්නට උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 5) (මුළු ල. 10)

03. i. ප්‍රධාන නාට්‍ය ශෛලීන් මොනවාද? (ල. 1)
 ii. එම නාටත්‍ය ශෛලීන්ට අදාළව උදාහරණ තුන බැගින් ලියන්න. (ල. 4)
 iii. ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරින් එක් නාට්‍ය ශෛලියක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 5) (මුළු ල. 10)

04. ''දෙයක් වේ නම් යම්, සුදුස්සාටම අයිති විය යුතු''
 i. ඉහත ප්‍රකාශය හා සම්බන්ධ නාට්‍ය කෘතිය කුමක්ද? (ල. 2)
 ii. ඔබ දන්නා නාට්‍යකරුවෙකුගේ නම ලියා ඔහුගේ නිර්මාණ 3 ක් ලියන්න. (ල. 4)
 iii. ඔබ කැමති නාට්‍යකරුවෙකුගේ නිර්මාණ හා ඔහුගේ කාර්යභාරය පිළිබඳව විස්තර කරන්න. (ල. 4)(මුළු ල. 10)

05. අත්තක පිරි මලක් ලෙසේ - පෙත්තක ඇඳි රුවක් ලෙසේ
 සත්තක මගේ පුතුගේ යසේ - නෙත් දෙක හැර බලන් මෙසේ
 i. ඉහත කවිය ඇතුළත් ශාන්තිකර්මය කුමක්ද? (ල. 1)
 ii. සූනියම් යකින්නගේ වේශේත්‍රයන් මොනවාද? (ල. 4)
 iii. ඔබ දන්නා බෞද්ධාගමික පූජාකර්ම 3 ක් ලියා ඉන් එක් පූජාකර්මයක් විස්තර කරන්න. (ල. 5) (මුළු ල. 10)

06. i. රංග අභ්‍යාස යනු කුමක්ද? හඳුන්වන්න. (ල. 2)

ii. ඔබ දන්නා රංග අභ්‍යාස වර්ග 5 ක් ලියන්න. (ල. 3)

iii. රංග අභ්‍යාස වලින් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ල. 5)

(මුළු ල. 10)

07. ඔබ කැමති මාතෘකාවක් යටතේ රංග විධාන යොදමින්, රංග කාලය විනාඩි 10 කට සරිලන සේ නාට්‍ය පිටපතක් ලියන්න. (ල. 10)

## III කොටස

### ප්‍රායෝගික පරීක්ෂණය (මුළු ලකුණු 100)

- **සියළු ප්‍රශ්නවලට සහභාගී වීම අනිවාර්යයි.**

1. i. දික්තල කාලගෝල නාට්‍යයෙන් තෝරා ගත් පෙළක් ඉදිරිපත් කරන්න.

   ii. ගුරුවරයා ලබා දෙන පෙළ ඉදිරිපත් කරන්න. (ල. 20)

2. නාට්‍ය ගීතයක් ඉදිරිපත් කරන්න. (ල. 15)
3. ගුරුවරයා විසින් ලබාදෙන ක්ෂණික නිරූපනයක් ඉදිරිපත් කරන්න. (ල. 10)
4. නාට්‍යානුසාරීව කතාවක් ඉදිරිපත් කරන්න. (ල. 15)
5. සමුහ රංගයක් ඉදිරිපත් කරන්න. (ල. 20)
6. නිර්මාණාත්මක රංග රචනයක් සමුහය සමග එක්ව ඉදිරිපත් කරන්න. (ල. 20)